# ස්තූප නිර්මාණයෙහි ආරම්භය හා විකාශය

(දෙවැනි කොටස)

**ආකෘතිය අනුව ස්තූප වර්ග කිරීම**

**බෞද්ධයන්ගේ අතිශය ගෞරවාදරයට පත් වූ ස්තූපය එයටම ආවේණික වූ ලක්ෂණයන් හේතුවෙන් එහි සුවිශේෂත්වයක් දැකිය හැකිය. එය ඊට ගෞරවය විමසිම කෙනකුගේ සැදැහැයැයි සිතුවිලි ජනනය වේ. ස්තූප ආකෘතිය දුර සිට නැරඹීමේදීත් සමීපයේ සිට නැරඹීමේදීත් එයටම ආවේණික වූ ආකෘතික ලක්ෂණ හේතුවෙන් එහි අැති සුවිශේෂී බව ප්‍රකට වේ. ඒ අනුව ස්තූපයක ආකෘතියට හිමිවන්නේ විශේෂ වටිනාකමකි. එබඳු ස්තූපයක ආකෘතිය කියම කර අැත්තේ ස්තූප, චේතිය යන නම්වලින් ද අණ්ඩ, උදර යන නම්වලින් ද හඳුන්වනු ලබන කොටසේ හැඩය පදනම් කරගෙනය. ඒ අනුව ස්තූපයේ පිළිබඳ අධ්‍යයනය කිරීම ආකෘතිය අනුලක්ෂණ බිඳ බැරෙන්නේ නම් එය ඉතා අර්ථවත් වේ. එසේ කළහොත් බලපතිව පැරැුණි පුස්කොළ පිටපතකට අනුව ස්තූප වර්ග හයක් ගැන සඳහන් වේ. එනම්,**

1. සණ්ඨාකාර
2. සෝකාකාර
3. ඝණ්ඨාකාර
4. ධාන්‍යාකාර
5. පද්මාකාර
6. ආමලකාකාර

වශයෙනි.

ක්‍රිව 7 වන ශතවර්ෂයට පමණ අයත් මඤ්ජු ශ්‍රී වාස්තු විද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථයෙහි ස්ථූප වර්ග පහක් සඳහන් වේ. එනම

1. ධාන්‍යරාශි
2. පද්මාකාර
3. සණ්ඨාකාර
4. ඝණ්ඨාකාර
5. පලාණ්ඩාකාර

යනුවෙනි.

මේ අතරින් ධාන්‍යරාශි හා ඝණ්ඨාකාර යන ආකෘතීන් දෙක පිළිබඳව මහාවංශයේ හා වංශත්ථප්පකාසිනියේ ද සඳහන් වේ. මේ ආකෘතීන්ට අමතරව වෙනත් බෞද්ධ රටවල වෙනත ආකෘති කිහිපයක් දක්නට ලැබේ. ඒවා අතර අණ්ඩාකාර (ඝණ්ඨාකාර හැඩය), චතුරශ්‍රාකාර (හතරස් ආකාරය), අෂ්ටාශ්‍රාකාර (අටපට්ටම හැඩය), සිලිණ්ඩරාකාර (සිලින්ඩරයක හැඩය) ආදී වශයෙනි. ඒ අනුව ස්තූප ආකෘති 12ක් පුධාන ලෙස දැකිය හැකිය.

**ධාන්‍යරාශි හැඩති ධාන්‍යාකාර**

ධාන්‍යය (වී) ගොඩක හැඩය ඇති ස්ථූප මේ වර්ගයට අයත් වේ. ක්‍රිපු. තුන්වන සියවසේ දී දේවානම්පියතිස්ස රජු ථූපාරාමය කරවන ලද්දේ මේ ආකෘතියට බව සඳහන් වේ. නමුත් පසුකාලීනව ථූපාරාමයේ කළ පුතිසංස්කරණ කටයුතු හේතුවෙන් මෙහි මුල් ආකෘතිය වෙනස් වී අද දකවිට ඝණ්ඨාකාර හැඩය ගෙන තිබේ. උතුරුඳිය ලළාතේ පිහිටපුදෙන් මෙහි ආකෘතියෙන් යුතු පැරණි ස්ථූපයක නටඹුන් මහාචාර්ය සෙනරත් පරණවිතාන විසින් සොයාගෙන ගෙන ඇති බව ද කියැසු ලැබේ. කැලණිය රජ මහා විහාරයේ ස්ථූපය ද ධාන්‍යාකාර වේ.

**ඝණ්ටාකාර**

ඝණ්ඨාවක හැඩැති ස්තූපය මේ නමින් හඳුන්වනු ලබයි. 8 වන හා 10 වන යාය සියවස්වල ශ්‍රී ලංකාවේ පුචලිත දිගටි හැඩයකින් යුක්ත ගර්භයක් සහිත ස්තූප මීට අයත් යැයි සැලකේ. සිඹෙය, බුරුමය, ශ්‍රී ලංකාව යන රටවල සණ්ඨාකාර වෛත්‍යය හෙවත් චේතිය දැකිය හැකිය. 11වන සියවසට අයත් මිහියංගණ ස්තූපය මේ ආකෘතියට අයත් වන බැලූකේ.

**ඝටාකාර**

සට හෙවත් කළයක හැඩය ඇති ඇති ස්ථූප වර්ගය ඝටාකාර ලෙස හඳුන්වනු ලබයි. මේ වෛත්‍යය විශේෂය මූල සර්වාස්තිවාද බෞද්ධයන් අතර ජනපියව පැවති බව පිළිගැනේ. තක්ෂලය මිට හෙතෙර, සෝමාවතී වෛත්‍යය, සිසුවිලවිව හා ගල්ල මහා විහාරයේ ස්ථූපය ද මුලින්ම මේ වර්ගයට අයත් බව ගෝලුහවිඩ සිද්ධිය සඳහන් කරයි. මෙම ආකෘතියට අයත් ස්ථූප නිහිඹතලේ ඉතා පුසිද්ධය.

**බුබ්බුලාකාර**

දිය බුබුලක හැඩය ඇති ස්ථූප මේ නමින් හඳුන්වනු ලබයි. දුටුගැමුණු රජු රුවන්වැලිසෑය කරවූයේ මේ හැඩයෙන් යුක්තවය. පොළොන්නරුවේ කිරිවෙහෙර හා රන්කොත් වෙහෙර ද මේ ගණයට අයත් ස්තූපයන් ය.

**පද්මාකාර**

විසුමක ආකෘතිය ඇති ස්තූප වේලිය මේ නමින් හඳුන්වනු ලැබේ. දැඩිමේ කොටවෙහෙර ධාතු ගර්භයක ගඩොලින් තනා තිබූ පද්මාකාර හැඩයෙන් යුක්ත ස්තූපයක් සොයාගෙන තිබේ. මුල දී කොටවෙහෙර මේ ආකෘතියෙන් තනා තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. පොළොන්නරුවේ දෙමළ මහාසෑය, පුත්තලම යුදගනා ස්ථූපය මේ වර්ගයට අයත් බව පරණවිතාන මහතා පුකාශ කරයි.

**ආමලකාකාර**

හෙල්ලි ගෙඩියක හැඩය ඇති ස්ථූප මේ වර්ගයට අයත් වේ. මේ වර්ගයේ ස්ථූපයන් තනා කරඳුවත්තේ ශ්‍රී ලංකාවෙන් ලැබී තැනැයි පරණවිතාන මහතා සඳහන් කරයි. එහෙත් දෙවැනි අග්බෝ රජු ආමලක චෛත්‍ය නමින් එතැන පුසිද්ධවූ ස්තූපයක් තබූ බවත් රජු බව වුලවංශයේ සඳහන් වේ. මෙය අමුලාකාර ස්තූපයක් වන්නට ඇත. දැඩිමේ කොටවෙහෙරින් අමුලකාර ධාතු කරඬුවක් ලැබී ඇත. ඉන්දියාවේ මේ වර්ගයේ ස්තූප දක්නට ලැබෙයි.

**අණ්ඩාකාර**

බිත්තරයක හැඩය ඇති ස්තූප මේ වර්ගයට අයත්ය. ඉදිකටු සෑය පිළිබඳ විස්තර කරන දිව්‍යාවදානේ ස්තූපයේ උදරය අණ්ඩ යනුවෙන් හඳුන්වා ඇත්තේ එය බිත්තරයක් සේවැලය ගත් නිසාවෙනි. එමෙන්ම රුවන්මැලි සෑයෙන් ලැබුණු කරඬුවක මෙකී හැඩය නිබී ඇත. පුතිසංස්කරණයෙන් කළ මිරිසවැටිය චෛත්‍ය ද අණ්ඩාකාර වේ.

**චතුරශ්‍රාකාර**

ස්තූපයක උදරය පමණක් නොව මුළු ගොඩනැගිල්ලම යට සිට කුඩා වන සේ චතුරශ්‍රාකාරව තනා ඇත්තේ මෙම ස්තූපයි. මහායාන රටවල ඇති පැගෝඩා මෙකී ආකෘතියෙන් යුක්තය.

පොළොන්නරුවේ සත්මහල් පුාසාදය දැනට දක්නට ලැබෙන මෙම ආකෘතියෙන් යුක්ත ස්තූපයකි. එමෙන්ම අනුරාධපුරයේ තඹා වෙහෙර, අනුරාධපුරයට නැගෙනහිර දිසාවෙහි මිහසෙන් රජු කර වූ ස්තූපය, අභයගිරි විහාරයේ දුටුගැමුණු ථූපය හා දරණ ආරාමයේ ස්තූපය ආදී ස්තූපයන් මෙම ආකෘතියෙන් යුක්තය.

**අෂ්ටාශ්‍රාකාරය**

අටපට්ටම හැඩයෙන් යුත් ස්තූප මේ ගණයට අයත් වේ. අටවිමණය සංකේත දිසා අනුව තබා තිබීම නිසා අනුරාධපුරයේ පාචීනතිස්ස පබ්බත විහාරයේ මේ වර්ගයේ ස්තූපයක් තිබුණ බවට සාධක නමුවේ. ලඩාක්ෂි මෙවැනි ස්තූප ඇති බව පියයෙව් සඳහන් කරයි.

**සිලිණ්ඩරාකාරය**

සිලින්ඩරයක් මෙන් ඇති ආකාතියකින් යුක්ත වූයේ මෙකී ස්තූපයි. විමල් විමර්ශන බුධින් අමිහාර දිස්ත්‍රික්කයේ කුඩුම්බල පුරෝණි ස්තූපය මේ ආකාතිය ගත් ස්තූපයක් යැයි සඳහන් කරයි. ඉන්දියාවේ බුදුරදුන්ගේ පරිනිර්වාණය සිදු වූ කුසිනාරාවේ මෙවන් ස්තූපයක් දක්නට ලැබේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය, කැබෑවිට්ටිය සරානාත් ධර්මනිකේතනාධිපති ආචාර්ය**

**එළමල්දෙණියේ සාරානන්ද ඉම**

**ථූපාරාමය**

ථූපාරාමය සඳහා කරන ලද ගෙය පූජාවර, දේවනිවාස යන නම්වලින් හඳුන්වනු ලබයි. චෛත්‍යය යන්න ථූපයට පර්යාය යදුනකි. ඉන්දියාවේ රාමගාමයේ තැන්පත් කර තිබුණු සව්වැලු ධාතු ලබාගත් නාගයෝ මාඝදේවිය නාග භවනයෙහි ස්තූපයක ඒවා තැන්පත් කොට එම ස්තූපයට ථූපසරයක් කර වූ බව සඳහන් වේ.

දේවානම්පියතිස්ස රජතුමා ථූපයක් කරවා එයට ගෙයක් ද කරවීය. එසඟ රජු ථූපාරාමයට ථූපසරයක් කරවීය. එනම් මෙයින් අදහස් වන්නේ ථූපයෙන් ථූපයට ගෙයක් කරවීමයි. එසඟ රජුගේ පොත්ථා නමැති මහෙසිය මහාබෝධි ආරාමයෙහි ථූපයක් හා ථූපසරයක් කරවූවාය. සංඝිට්ඨ තිස්ස රජු මණිසෝණ විහාරයේ සහ අම්බසේරුගලේ ස්ථූපවලට ථූපසරය කරවීය. තව ද ඔහු පාංචපිරිවේණේ ථූපයට ථූපසරය කරවීය. මේ සියලු පාංචපිරිවේණේ ථූපසරයන් සම්බන්ධ වූ බව සඳහන් වේ. දේවානම්පියතිස්ස රජතුමා ථූපසරයක් කරන ලද ගෙය පමණක් අදහස් කරන බවයි.

වූලාභයගේ ධාතුසර, ධාතුගර්භය යන නම්වලින් ද හඳුන්වා ඇත්තේ ථූපසර හා චෛත්‍යසර යනුවෙන් හඳුන්වනු ලැබූ ගොඩනැගිලි විශේෂයයි. මේ සඳහා නිදසුන් වශයෙන් අනුරාධ සෙනෙවිරත්න මහතාගේ වරදෙන් නම් කෘතියේ සඳහන් වන්නේ දෙවැනි අග්බෝධි රජු ථූපාරාම ථූපය පුතිසංස්කරණය කරවා එය වටා පර්යාංකාසනත නතබඳවා ඒවා මත බුදු පිළිම තැන්පත් කළේ ය. තව ද ඔහු ධාතුඝරයෙහි විකුර්ණඳිය ද ගල් හා ඇුන් දත් කැටයම් ද රන් තඹ ද තරඹු බවයි. මෙහි සඳහන් ධාතුඝර යන පදයෙන් හැඳින්වෙන්නේ ථූපසර සඳහා පදයට මෙහි වූ බවත්, ධාතුගර්භ විශේෂය නවීකරණයට පත්වීමෙන් පසුවය එනම් ථූපය හතර පැත්තේ පර්යාංකාසනවල බුදු පිළිම හතරක් තැබීමෙන් මෙම නවීකරණය සිදුකර තිබේ. බුදු පිළිම පර්යාංකාසන මත තැබූ බව සඳහන් කිරීමෙන් පැහැදිලි වන්නේ එම පිළිම ධ්‍යානී බුදු පිළිම වශයෙන් සැලකිය යුතු බවයි. ථූපය සඳහා කළ පරිදි ථූපසරය සඳහා ථූපය පමණක් අයත් වුව ද පසුකාලීනව ථූපය හා ඒ වටා ඇති ධ්‍යානී බුදු පිළිමද එයට අයත් වූ බවය. එම නිසාම ඒ සඳහා ථූපසර යන නාමය වෙනුවට ධාතුඝර යන වාවහාරය සිදු කළ බව සඳහන් කළ හැකිය.

ධාතුඝර යන පදයේ සිංහල තේරුම වන්නේ දාගෙ යන්නයි. 4 වැනි මිණිදු රජුගේ මිණිත්තලා සෙල් ලිපියේ දැකිය හැකි යතුවෙන් සඳහන් වී ඇති බව පුවාවලිය සඳහන් කරයි. තවද්දරත් එහි සඳහන් වන්නේ බුද්ධාභිෂේකය ද පැැවැත්වූ බවයි. බුද්ධාභිෂේකයක් පැවැත්විය හැකි බුදු පිළිම ද අවශ්‍ය වේ. ඒ නිසා මෙහි සඳහන් දගෙයි බුදු පිළිම තිබූ බවට නිගමනය කළ හැකිවේ. එබැවින් මෙහි ද දගෙය යන්නට ථූපය හා බුදු පිළිම ද අයත් වූ බව පැහැදිලි වේ.

මේ හා සම්බන්ධ අනෙක් වාවහාරය වන්නේ වරදෙය යන්නයි. දගෙය යන වචනයට මුලින් වට (ඇවරණ) යන විශේෂණය එකතු වීමෙන් වරදගෙය යන වචනය සැකසී තිබේ. පොළොන්නරුව වටදගේ, ථූපාරම වටදගේ, අත්තනගල්ලේ වටදගේ පිළිබඳව පුවාවලියේ මෙන්ම දඳඋ සිරිමෙකි දැක්වේ. මෙම වටදගෙවල්හි ථූප ගැන පමණක් සඳහන් වුව ද අත්තනගල්ලේ වටදගෙයෙහි ඇති බුදු පිළිම අදත් දක්නට ලැබෙයි. එබැවින් වටදගෙය යන්න ද ධාතුඝර, දගේ වාවහාරයේම වර්ධනීය අවස්ථාවක් වශයෙන් සැලකිය හැකිය.

අනුරාධපුර හත්ථිකුච්ඡි විහාරයේ ථූපසරයේ බුදු පිළිම රාශිය. ථූපාරම ථූපසරයේ ද බුලිත් බුදු පිළිම මෙන්ම මොනෙස්සිඤ අතර දෙවැනි අග්බෝ රජු පිහිටි පසුව එයට බුදු පිළිම තැන්පත් කරන ලදී. තනවැනි අග්බෝධි රජු දඹුල ඔලය රාජාසනය විසින් මණ්ඩලඝරිය හෙවත් ඔළිරිවේ විහාරයේ ථූපයට කරවන ලද ධාතුඝරයෙහි ථූපය වටා පිවූ දිසාවට මුහුණලා සිටින ධ්‍යානී බුදු පිළිම තුනක් ද තිබේ. එමෙන්ම පොළොන්නරුව වටදගෙය ද ථූපයක් හා ඒ වටා ධ්‍යානී බුදු පිළිම හතරක් ද වෙයි.

ස්තූපයක කොටස්

ස්තූපයක කොටස් පිළිබඳ අධ්‍යයනයේ දී පෙනී යන්නේ ඒ ඒ මූලයන්ට අනුව ස්ථූපයේ කොටස් විවිධ අයුරින් නම් කර ඇති ආකාරයකි. විද්‍යාවදනයේ දී ස්ථූපයක කොටස් ලෙස සතර දිගටි සෝපාණ, ත්‍රිමේධි, අණ්ඩ, වුලාඡත්ය, හර්මිකා, ශතුයෂ්ඨි, ඡත්‍ර, වර්ෂාස්වාරාදි හා මහාමණි යනුවෙන් දක්වා තිබේ.

විෂ්ණුධර්මෝත්තරපුරාණයේ දෙවුළක මුඩු වූ ස්තූප විශේෂයේ එයට අයත් කොටස් වශයෙන් සෝපාණ 4, පීඨ, ලිංග, යෂ්ටි, භූමිකා 13, යෂ්ටි, සතරදිගු රූප හා ලෝකපාල රූප ලෙස සඳහන් වේ. මූලසර්වස්තිවාදීන්ගේ විනය ක්ෂුද්‍රක වස්තුගෙහි ස්තූපයක කොටස් ලෙස වේදිකා හතර, කරණ්ඩක, සට, ලෝණ, යෂ්ටි, ඡත්‍ර හා වර්ෂාස්වාරයි යනුවෙන් දක්වා තිබේ.

ශ්‍රී ලංකාවේ ක්‍රිපූ. 3 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂාරම්භය දක්වා ස්ථූපයට අයත් කොටස් වශයෙන් සැලකුවේ පුප්වාසන, උදර, චතුරස්සඅය, ඡත්‍ර, චන්ද්‍ර හා සූර්ය රූප පමණි. නමුත් වර්තමානය වනවිට ස්තූපයට අයත් පුධාන ලක්ෂණ වශයෙන් සඳහන, වාතාල්කර, පේසා වළලු, ගර්භය, හතරස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල, කොත හා සිවමණ දක්වීය හැකිය. ස්තූපය ගැඹුරු ආගමික අැදහක් දනවන බව පුජාවලියේ අන්ධිවාපකතිස් ලැබූ කොතෙනුරුවලින් දැනගත හැකි ය. එනම්,

**පදනමෙන් - සුවාසූ දහසක් ධර්මස්කන්ධය**
**තුන් මහල් පේසාවෙන් - ත්‍රිවිධධර්තය**
**ගර්භයෙන් - සත්පිස් බෝධිපාක්ෂික ධර්ම**
**හතරැස් කොටුවෙන් - චතුරාර්ය සත්‍ය**
**දේවතා කොටුව - දිව්‍ය ලෝකය**
**කොත් කැරැල්ලෙන් - නවලොක සත්ව සාසනය**
**කොතින් - නිවර්ණය සංකේතවත් කරයි.**

**ස්තූපයක අංග**